# දැන්වීමයි

## රුහුණ විශ්වවිද්‍යාලයීය ශිෂ්‍ය ශිෂ්‍යාවන් සඳහා කොවිඩ් 19 එන්නත්කරණය

වයස අවුරුදු 20 - 30ත් අතර තරුණ ප්‍රජාව සඳහා කොවිඩ් 19 එන්නත්කරණය සිදු කිරීමට රජය විසින් මේ වනවිට තීරණය කර තිබේ. සියලුම රාජ්‍ය විශ්වවිද්‍යාලයන්හි සිසුන් හා කාර්ය මණ්ඩලයන් එන්නත්කරණයට ලක්කර ඉක්මනින් රාජ්‍ය විශ්වවිද්‍යාල විවෘත කිරීමට පියවර ගන්නා ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසන් සභාව හා සියලුම විශ්වවිද්‍යාලයන්හි උපකුලපතිවරුන් විසින් රජයට අවධාරණය කරනු ලැබීය.

රජය විසින් මෙම ඉල්ලීම පිළිබඳව සාකච්ඡා කිරීමෙන් අනතුරුව, පළමු පියවර ලෙස විශ්වවිද්‍යාල කාර්යමණ්ඩල එන්නත්කරණය කිරීම සිදු කරන ලදි. කෙසේ නමුත්, විවිධ හේතූන් මුල් කරගෙන විශ්වවිද්‍යාල සිසුන් එන්නත්කරණ කිරීම ප්‍රමාද විය.

කෙසේ වෙතත් මේ වනවිට ප්‍රමාණවත් එන්නත් මාත්‍රා පැවතීම හේතුවෙන් වයස අවුරුදු 20 - 30ත් අතර ප්‍රජාව එන්නත්කරණය කිරීමට රජයේ අවධානය යොමු වී තිබේ. ඒ අනුව එම වයස් කාණ්ඩයට අයත් පිරිස් එන්නත්කරණය පසුගියදා ආරම්භ විය.

පවත්නා තත්ත්වය තුළ කිසිදු විශ්වවිද්‍යාලයකට ශිෂ්‍ය කණ්ඩායම් කැඳවමින් විශේෂ එන්නත්කරණ වැඩසටහන් ක්‍රියාත්මක කළ නොහැක. ඒ අනුව විශ්වවිද්‍යාලය හරහා ඔබට එන්නත ලබා ගැනීමට දැනට අවස්ථාවක් නොමැත. ඔබ අයත් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කොට්ඨාසය මගින් ඔබට එන්නත ලබා ගැනීමට සිදුවනු ඇත.

ඒ අනුව රුහුණු විශ්වවිද්‍යාලීය සියලුම ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට තම ප්‍රාදේශීය සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කොට්ඨාසයේ සායනය මගින් තම එන්නත ලබා ගන්නා ලෙස මම ඉල්ලා සිටිමි. මේ සඳහා ඔබට අවශ්‍ය නම් ඔබගේ විශ්වවිද්‍යාලයීය හැඳුනුම්පත ඉදිරිපත් කළ හැකිය. නමුත් පොදුවේ වයස අවුරුදු 20 - 30ත් අතර සියලුදෙනා එන්නත්කරණය කිරීමට රජය විසින් තීරණය කර ඇති බැවින් එය අත්‍යවශ්‍ය නොවනු ඇත. එන්නත ලබා ගැනීම සඳහා ඔබගේ ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කළ යුතු වනු ඇත.

ඔබගේ ප්‍රදේශයේ එන්නත්කරණ වැඩසටහන් ක්‍රියාත්මක වූ වහාම හැකි ඉක්මනින් ඔබට හිමි එන්නත ලබා ගන්නා ලෙස මම අවධාරණය කර සිටිමි. සියලුදෙනාම නියමිත එන්නතෙහි මාත්‍රා 02ම ලබා ගත යුතු අතර දෙවැනි එන්නත් මාත්‍රාව ලබා ගැනීමෙන් සති 02කට පසු ඔබගේ ශරීරය තුළ අවශ්‍ය ප්‍රතිශක්තිකරණය ගොඩනැගෙනු ඇත.

විශ්වවිද්‍යාල නැවත විවෘත කිරීම සඳහා සියලුම සිසුන් එන්නත්කරණයට ලක් වී සිටීම අතිශයින්ම උපකාරීවනු ඇත. මෙම කොවිඩ් 19 වසංගත ව්‍යාප්තිය හමුවේ එන්නත ලබා නොගත් ඕනෑම පුද්ගලයෙකු අනාරක්ෂිතය. එවන් පුද්ගලයෙකු සමාජයේ අනෙකුත් ප්‍රජාවගේද අනාරක්ෂිත බවට

හේතු වේ. මෙම එන්නත් පිළිබඳව පවත්නා අනවශ්‍ය භීතිය හා සැකය හේතුවෙන් ඇතැම් පුද්ගලයින් එන්නත් ලබා ගැනීමට මැලිකමක් දක්වයි. මේ හේතුවෙන් කොවිඩ් 19 මරණ අතරින් 99%ක්ම එන්නත්කරණයට ලක් නොවූ පිරිස් තුළින් වාර්තා වේ.

දැනට ශ්‍රී ලංකාව තුළ කොවිඩ් 19 රෝගය සඳහා ලබාදෙන සියලුම එන්නත් ආරක්ෂිතය. එම කිසිඳු එන්නතක් මගින් දරුණු සංකූලතා වාර්තා වී නොමැත. එබැවින් මේ අවස්ථාවේ ඔබට ලබාදෙන ඕනෑම එන්නතක් හොඳම එන්නත් බව අවබෝධ කර ගැනීම වැදගත්ය. ඔබගේ ප්‍රදේශයේ ලබා දෙන එන්නත කුමක් වුවද එය ලබා ගන්නා ලෙස මම නිර්දේශ කරමි. ඔබට අවශ්‍ය හෝ ඔබ කැමති එන්නතක් ලැබෙන තෙක් බලා සිටීමට මෙය සුදුසු වාතාවරණයක් නොවේ. කරුණාකර ඔබට හිමිවන එන්නත නොපැකිලිව ලබාගන්න.

සමස්ත විශ්වවිද්‍යාලීය ප්‍රජාව (සිසුන් හා කාර්ය මණ්ඩලය) එන්නත්කරණය වී ඇත්නම්, දැඩි සෞඛ්‍ය මාර්ගෝපදේශවලට අනුගත වෙමින් අපට ඉක්මනින් ම නැවත විශ්වවිද්‍යාලය විවෘත කිරීමට හැකි වනු ඇත. එබැවින් මේ වනතෙක් එන්නත ලබා නොගත් සියලුම සිසුන්ට, තම ප්‍රදේශයේ එන්නත්කරණ වැඩසටහන් ඇරඹි වහාම එන්නත ලබා ගන්නා ලෙස මම ඉල්ලා සිටිමි.

මහාචාර්ය සුජීව අමරසේන
උපකුලපති.
රුහුණ විශ්වවිද්‍යාලය.